# පේරාදෙණිය විශ්වවිද්‍යාලය

## 2024/2025 වර්ෂය සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සේවක ආපනශාලා හා අලෙවිසැල් පවත්වා ගෙන යාම සඳහා මිල ගණන් කැඳවීම

- පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් වර්ෂයක කාලයක් සඳහා පහත සඳහන් සේවක ආපනශාලා හා අලෙවිසැල් පවත්වා ගෙන යාම සඳහා පිළිගත් ආයතන වලින් සහ පළපුරුදු පුද්ගලයින්ගෙන් 2024.04.04 දින සිට 2024.04.30 දින දක්වා මිල ගණන් කැඳවනු ලැබේ.

- ආපසු නොගෙවන රු 1,000.00 ක ගාස්තුවක් විශ්වවිද්‍යාලයේ සරප් අංශය වෙත ගෙවා අයදුම්පත් සහ විස්තර පත්‍රිකා 2024.04.04 දින සිට 2024.04.30 දින දක්වා වැඩ කරන දිනයන් හි පෙ.ව 9.00 සිට ප.ව 3.00 දක්වා සරප් අංශයෙන් ලබා ගත හැකිය. නිසිලෙස සම්පූර්ණ කර මුද්‍රා තබන ලද අයදුම්පත් 2024.05.02 දින ප.ව 1.00 ට හෝ ඊට පෙර ලැබෙන සේ ***"සභාපති,ප්‍රසම්පාදන කමිටුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය"*** යන ලිපිනයට ලියාපදිංචි තැපෑල මගින් හෝ ලේඛකාධිකාරී කාර්යාලයේ තබා ඇති ලංසු බහාලුමේ තැන්පත් කිරීම කළ යුතුය. අදාළ අයදුම්පත් එදිනම ප.ව 1.30 ට විවෘත කරනු ලැබේ. ලංසු පත්‍රිකා බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවරේ **විශ්වවිද්‍යාල සේවක ආපනශාලා හා අලෙවිසැල් පවත්වා ගෙන යාම සඳහා මිල ගණන් කැඳවීම 2024/2025 ලෙස සඳහන් කර අයදුම්කරන ආපනශාලාවේ හෝ සේවා ස්ථානයේ නම සඳහන් කිරීම අනිවාර්ය වේ.**

  (උදා - සනාථන මන්දිර ආපනශාලාව - 01 සඳහා මිල ගණන් - 2024/2025)

- එක් අයදුම්පතක් සඳහා රු.5,000.00 ක වටිනාකමකින් යුත් නැවත ගෙවනු ලබන ලංසු ඇපකරයක් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ උපකුලපති නමින් 2024.07.31 දින දක්වා වලංගු වන පරිදි ලබා දිය යුතුය. එසේ නොමැති නම් ඒ හා සමාන මුදලක් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සරප් අංශයේ තැන්පත් කළ යුතු අතර ලැබෙන ලදුපත ලංසු ලේඛන සමග අමුණා එවිය යුතුවේ.

- සේවාව අවශ්‍ය කරන ආපනශාලා හා සේවා ස්ථාන පහත දක්වා ඇත.

| | |
|---|---|
| 01 | සනාතන මන්දිර සේවක ආපන ශාලාව 1<br>(සනාතන මන්දිර ඉහල මහල) |
| 02 | සනාතන මන්දිර සුභ සාධක ආපන ශාලාව 2<br>(තැපැල් අංශය අසල ) |
| 03 | ආරක්ෂක අංශ සේවක ආපනශාලාව |

- මෙම සේවාවන් සැපයීම සඳහා ඉදිරිපත් කරනු ලබන මිල ගණන් සලකා බැලීම, කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සහ කිසිදු හේතු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ බලය විශ්වවිද්‍යාලය සතු වේ.

වැඩි විස්තර සඳහා පහත සඳහන් දුරකථන අංක අමතන්න.

සහකාර ලේඛකාධිකාරී, සාමාන්‍ය සේවා අංශය.

081- 2392438 081-2392436



සභාපති,
ප්‍රසම්පාදන කමිටුව
පේරාදෙණිය විශ්වවිද්‍යාලය